මෙම ග්‍රාම නිලධාරී වසමට අයත් දෙටුජනපදය නම් ගම වර්ෂ 1956දී බලයට පත් එස්.ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායක අගමැතිතුමාගේ රජය මගින් ජොෂ්ය විභාගය සමතුන් පදිංචි කරවීමට ඉඩම් අක්කර තුන බැගින්දී ජනපදයක් ලෙස ආරම්භ කෙරුණකි. එය ''ජොෂ්ය කොළණිය'' හා ''දෙටු ජනපදය'' නමින් හඳුන්වන්නේ එලෙස ජොෂ්ය විභාගය සමතුන් පදිංචි වු බැවිනි.

## 16 ඩී නානතොටපළාත

**වසමේ පිහිටීම**

උතුර - ඇළ මාර්ගය
නැගෙනහිර - 16 සී, බොරළුකැටිය
දකුණ - කොස්ගොඩ - ඌරගහ පාර
බටහිර - නාපේ වසම

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

ප්‍රදේශවාසීන්ගේ ජල අවශ්‍යතා සපුරා ගන්නා ලද නාන තොටක් තිබූ බැවින් ''නානතොට පළාත'' යනුවෙන් භාවිතා වී ඇත.කුරුඳු හා වී ගොවිතැන මූලික කරගත් ග්‍රාමීය ජනතාවගෙන් 99% ග්‍රාමීයව බෞද්ධ සංස්කෘතිකාංග මතින් ජීවත් වෙයි. නෙල්ලි ගස් බහුලව තිබූ හෙයින් ''නෙල්ලි ගස් කැලේ'' යනුවෙන් හඳුන්වන ග්‍රාමයක් ද මෙම වසමේ පිහිටා ඇත.

## 17 හැගල්ල පියගම

**වසමේ පිහිටීම**

උතුර - 17 සී කුඩාගොඩගම ග්‍රා.නි.වසම
නැගෙනහිර - 17 ඒ කොස්ගොඩ ග්‍රා.නි.වසම

දකුණ - 17ඩී ගොඩපිටිය ග්‍රා.නි.වසම
බටහිර - කරිජ්ජපිටිය වෙල්යාය

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

හැගල්ල ගමට නම පටබැඳුණු ආකාරය පිළිබඳව මත දෙකක් වේ. ''හී'' යනුවෙන් හඳුන්වනුයේ කුඹුරුවලට බවත් කුඹුරු යායක් තිබූ හෙයින් ''හී ගාල'', ''හී ගල්ල''වී පසුව ''හැගල්ල'' වූ බව එක් මතයකි. අශ්වයන් හඳුන්වනුයේ ''හේ'' යනුවෙනි. හේ ගාල් කළ තැන හේ ගාල ''හේ ගල්ල'' වී පසුව ''හැගල්ල'' වූ බව දෙවන මතයයි. ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහතාගේ පියාණන් වන රිචඩ් රණසිංහ මහතාගේ නිජබිම වූයේ ද හැගල්ලයි. සිය පියාණන්ට උපහාරයක් වශයෙන් උදාගම් වැඩපිළිවෙල යටතේ ''පියගම'' නමින් සංවර්ධනය කළේ ය. ඇඟලුම් ආයතන දෙකක් සහ පියගම උප දුම්රිය නැවතුම් පොළක් ද ස්ථාපිත කළ අතර හැගල්ල පියගම ලෙසින් ග්‍රාම නිලධාරී වසමක් ද පිහිටු විය.

<u>**17 ඒ කොස්ගොඩ**</u>

**වසමේ පිහිටීම**

උතුර - 15 දූවේමෝදර ග්‍රාම නිලධාරි වසම
නැගෙනහිර - ගාලු පාර
දකුණ - 18 අහුන්ගල්ල ග්‍රාම නිලධාරි වසම
බටහිර - මුහුදු තීරය

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

දකුණින් ගාල්ල ග්‍රාමයෙන් උතුරින් දූවේමෝදර ග්‍රාමයෙන් ද නැගෙනහිරින් ගාලු පාරෙන් ද බටහිරින් මුහුදු තීරයෙන් ද වට වූ ග්‍රාම නිලධාරි වසම දේවපතිරාජයන් විසින් නිර්මාණය කරන ලද්දක් බව සඳහන් වේ.

මහා දෙල් වනයක් කපා විනාශ කොට කොස් උයනක් කළ හෙයින් ''**කොස්ගොඩ**'' නම් විය. ඒ බව පැරණි කවියක මෙසේ සඳහන් වේ.

පිම්බර බිමකි ගැවසුණු දෙල් ගස් බොහෝ සේ
ගලවා දමා දෙල් එම ගම් පිය සේ
කොස් ගස් සිටෙව්වා මේ හැම තැන සතො සේ
කොස්ගොඩ විය ඒ ගම්වර පෙර ද මෙ සේ

දේව පතිරාජ ඇමැතිතුමා විසින් තම වගකීම් නිසි ලෙස ඉටු කිරීම නිසා සතුටට පත් පණ්ඩිත දෙවන පරාක්‍රමබාහු රජතුමා තුටු පඬුරු ලෙස ඇමැතිතුමාගේ ඥාතීන්ට ගම්වර ලබා දී ඇත.

පතිරාජ ඇමතිතුමා සංවර්ධනය කළ වෙල් යායවලින් එකක් හිද්දරුව ප්‍රදේශයේ තිබිණි. එවකට හිද්දරුවේ මුහුදු වෙරළට ආසන්නව කරදිය පොකුණක් තිබී ඇත. ඇමැතිතුමා මෙම පොකුණෙන් කරදිය නෑමෙන් පසු කමත මත සිට සරුවට වැඩී තිබූ ගොයම් යාය දැක ප්‍රීති ප්‍රමෝදයට පත් ව රුවට සිද්ධවී තිබෙනවා යැයි කීය. රුවට සිද්ධ වීම ''රුව සිද්ධ'', ''සිද්දරුව''වී පසුව ''හිද්දරුව'' යැයි කියනු ලැබේ. දේව පතිරාජ ඇමතිතුමාගේ හමුදා සේනාංකවල සෙබළුන් සිප් හැදැරූ තැන ''සිප්දැරුව'' විය. පසුව ''හිද්දරුව'' වූ බව තවත් මතයකි.

## 17 බී මහපිටිය

**වසමේ පිහිටීම**

| | |
|---|---|
| උතුර | - 16 ඒ නාපේ, 16 ඩී නානතොට පළාත ග්‍රාම නිලධාරි වසම් |
| නැගෙනහිර | - 24 ඩී පතිරාජ පෙදෙස ග්‍රාම නිලධාරි වසම |
| දකුණ | - 17 සී කුඩාගොඩගම ග්‍රාම නිලධාරි වසම |
| බස්නාහිර | - 17 ඒ කොස්ගොඩ ග්‍රාම නිලධාරි වසම |

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

කොවුල් සංදේශයේ ද සඳහන් වන දේවපතිරාජ ඇමැතිතුමා විසින් අස්වද්දන ලද බව කියන වෙල් යාය ඉස්මත්තේ පිහිටි ප්‍රදේශය ''මානිමගොඩැල්ල'' යනුවෙන් හැඳින්වනුයේ පෘතුග්‍රීසි නැවියෙක් පදිංචි ව සිටි හෙයින් බව ඉතිහාසයේ සඳහන් වෙයි. ඇමැතිතුමාගේ අලි ඇතුන් ගාල් කිරීම හා අවි ආයුධ ගබඩා කළ තැනක් විය. ඒ තැනින් ඇමැතිතුමාට මහා බලයක් ලැබීම නිසා ''මහා බලය'' නමින් හැඳින්විය. පසු කාලයේදී ''මහපිටිය'' යනුවෙන් උච්චාරණය විය. කොස්ගොඩ ගොඩගම චෛතියාසන්නාරාමය අසල දේවපතිරාජ ඇමැතිතුමාගේ සොහොන යැයි විශ්වාස කරන උස්ගොඩැල්ලක් මෙන් ම අලි ඇතුන් බඳින ලද ගල් කුළුනක් ද ඒ ආසන්නයේ පිහිටා තිබීමෙන් මේ බව සනාථ වේ.

## 17 සී කුඩාගොඩගම

**වසමේ පිහිටීම**

| | |
|---|---|
| උතුර | - 17 බී මහපිටිය ග්‍රාම නිලධාරි වසම |
| නැගෙනහිර | - 24 බී කටුවිල ග්‍රාම නිලධාරි වසම |
| දකුණ | - 17 හැගල්ල පියගම ග්‍රාම නිලධාරි වසම |
| බටහිර | - 17 ඒ කොස්ගොඩ ග්‍රාම නිලධාරි වසම |

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

දේවපතිරාජ අමාත්‍යතුමාගේ සම්භවයකින් යුක්ත වසමක් ලෙස ද හැඳින්වේ. මෙහි ඇති ගමක් වන වෙලන්ගොඩ නම් ගමට එම නම සැදී ඇත්තේ වෙලෙන් එගොඩ ප්‍රදේශය යැයි හඳුන්වා පසුව ''වෙලන්ගොඩ'' වී යැයි හැඳින්වීමෙන් බවට ජනවහරේ මතයක් පවතී.

## 17 ඩී ගොඩපිටිය

**වසමේ පිහිටීම**

| | |
|---|---|
| උතුර | - ගාලු පාර |
| නැගෙනහිර | - 17 හැගල්ල පියගම ග්‍රාම නිලධාරි වසම |
| දකුණ | - වක් ඔය ඇළ |
| බටහිර | - 24 සී බෝගහපිටිය ග්‍රාම නිලධාරි වසම |

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

ගමේ උසම ස්ථානයේ පිහිටි පුදබිම හේතුවෙන් ''ගොඩපිටිය'' යනුවෙන් හඳුන්වා තිබේ. මෙම ප්‍රදේශයේදී දේව පතිරාජ ඇමතිතුමා සේනාව රැස් කළ බැවින් ගොඩපිටිය නම් වූ බව තවත් මතයෙක දැක්වේ.

## <u>18 අහුන්ගල්ල</u>

**වසමේ පිහිටීම**

උතුර - 19 ඒ වතුරේගම ග්‍රාම නිලධාරි වසම
නැඟෙනහිර - ඉන්දියන් සාගරය
දකුණ - 17 ඒ කොස්ගොඩ ග්‍රාම නිලධාරි වසම
බටහිර - 18 ඒ මිද්දරමුල්ල ග්‍රාම නිලධාරි වසම

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

අහුන්ගල්ල යන නම ඇති වූ ආකාරය පිළබඳ ජනප්‍රවාද මත 03කි.

01.අහු ගස්වලින් පිරුණු කැළයක් තිබීම " අහුගාල" ලෙස හඳුන්වා තිබූ අතර එය අහුන්ගල්ල ලෙස ද පහසුව සඳහා අහුන්ගල්ල ලෙස ද පසු කාලයේ හඳුන්වා දී ඇත.

02.දේව පතිරාජ ඇමතියාගේ අශ්ව කඳවුර තිබූ ප්‍රදේශය ගල්කන්ද හංදියේ සමීපයේ පිහිටා තිබී ඇත. අසුන්ගාල් කර ඇති ස්ථානය නිසා අහුන්ගල්ල වූ අතර පසු කාලයේ උච්චාරණය පහසුව සඳහා අහුන්ගල්ල ලෙස නම් කර ඇත.

03.කැලණියේ සිට මාගම රාජධානිය දක්වා දිවෙන මාර්ගයේ ගමන් කරන අයට වෙහෙස නිවා ගැනීම සඳහා තැනින් තැන වාඩි වීමට ආසන ගල් තිබූ නිසාත් අසුන් ගැනීම සිදු වූ නිසාත් ආසනගල් අසුන්ගල් ලෙස නම පටබැඳි තිබූ අතර පසු කාලයේ ඒ නම අහුන්ගල්ල ලෙස හඳුන්වා ඇත.

අහුන්ගල්ල තොටවත්ත ගම්මානය මුහුදේ යාත්‍රා කරන ඔරු පාරු ගොඩ කළ තොටුපළක් තිබූ නිසා "තොටවත්ත" නමින් හඳුන්වන අතර කිරිල්ල ඇළෙන් එගොඩ ප්‍රදේශය "එගොඩමුල්ල" ලෙසින් හඳුන්වයි.

## <u>18 ඒ මිද්දරමුල්ල</u>

**වසමේ පිහිටීම**

උතුර - 17 ඕ ගොඩපිටිය ග්‍රාම නිලධාරි වසම
නැගෙනහිර - 24 සී බෝගහපිටිය, 24 ගල්වෙහෙර සහ 19 බී මාකුඹුර යන ග්‍රාම නිලධාරී වසම්
දකුණ - 19 ඒ වතුරේගම ග්‍රාම නිලධාරි වසම
බටහිර - 18 අහුන්ගල්ල ග්‍රාම නිලධාරී වසමට

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

අහුන්ගල්ල නගරයේ සිට දකුණු දෙසට වූ ගම "මිද්දරමුල්ල" ය. මුහුදු වෙරළ ආශ්‍රිතව වැවෙන ශාකයක් වනුයේ වල් මිදි ශාකයයි. කුඩා දරුවන්ට පළමුවෙන් ඉඳුල් කට ගෑමේදී බත් පිස ගැනීමට වල්මිදි දර උපයෝගී කර ගන්නා බැවින් වටිනාකමක් ලැබී ඇත. එම ශාක බහුල වශයෙන් වැවෙන හෙයින් "මිද්දරමුල්ල" යන නම මෙම ගමට පටබැඳුණු බව ජනවහරේ පවතී. අහුන්ගල්ල දුම්රිය ස්ථානය පසුකර යන විට වම්පස පෙදෙස වැලිකන්ද විය. මෙහි වැලි කඳුවලින් පිරී පැවති නිසා "වැලිකන්ද" යන

නම පටබැඳී ඇත. දකුණු පස පෙදෙස වගුරු බිමක් විය. වැලිකන්දෙන් වැලි ගෙනැවිත් ගොඩගැසූ පෙදෙස වැලිගොඩ විය. එහි මරදන් වැල්ලෙන් පිරී පැවතීම නිසා මරදාන යනුවෙන් ද හැඳින්වේ.

මිද්දරමුල්ල ග්‍රාම නිලධාරී වසමට අයත් ගම් කිහිපයක නම් සෑදී ඇත්තේ දේවපතිරාජ ඇමතිවරයා විසින් වගා කරන ලද ඇතැම් බෝග හේතු කොට ගෙන ය. කැකිරි වගා කළ වත්ත "කැකිරිවත්ත" වූ අතර මුං වගා කළ වත්ත "මුංවත්ත" විය. එහි පැරණි පොදු නාන ළිඳක් තිබෙන අතර එය "මුංවත්ත ළිඳ" විය. එමෙන්ම කෝපි වගා කළ වත්ත "කෝපිවත්ත" විය.

## 19 වැල්ලබඩ

**වසමේ පිහිටීම**

උතුර - 19 ඒ වතුරේගම ග්‍රාම නිලධාරී වසම
නැගෙනහිර - ගාලු පාර (20ඒ පාතේගම්ගොඩ ග්‍රාම නිලධාරී වසමට යාබදව)
දකුණ - 20 බ්‍රාහ්මණවත්ත උතුර ග්‍රාම නිලධාරී වසම
බටහිර - ඉන්දියන් සාගරය

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

මෙම ග්‍රාමය වෙරළට ආසන්න පිහිටි වෙරළබඩ ප්‍රදේශයක පවතින බැවින් "වැල්ලබඩ" යනුවෙන් ව්‍යවහාර වී ඇත.

## 19 ඒ වතුරේගම

**වසමේ පිහිටීම**

උතුර - 18 අහුන්ගල්ල ග්‍රාම නිලධාරී වසම
නැගෙනහිර - 19 සී කදිරගොන්න ග්‍රාම නිලධාරී වසම
දකුණ - 19 වැල්ලබඩ ග්‍රාම නිලධාරී වසම
බටහිර - ඉන්දියන් සාගරය

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

ලන්දේසි යුධ සමයේදී සෙබලුන් ගිමන් හැරීමට හා වතුර ලබා ගැනීමට පැමිණ ඇත්තේ මෙම ග්‍රාමයට ය. එබැවින් අතීතයේදි ජනතාව මෙම ගම "වතුරුගම" ලෙස හඳුන්වා ඇත. පසුව වතුරුගම "වතුරේගම" ලෙස භාවිතා වී ඇත. නිතර නිතර වතුරෙන් යට වන හෙයින් "වතුරේගම" ලෙස හැඳින්වූ බව තවත් මතයකි.

## 19 බී මාකුඹුර

**වසමේ පිහිටීම**

උතුර - 24 ගල්වෙහෙර ග්‍රාම නිලධාරී වසම
නැගෙනහිර - 19 සී කදිරගොන්න ග්‍රාම නිලධාරී වසම
දකුණ - 19 ඒ වතුරේගම ග්‍රාම නිලධාරී වසම
බස්නාහිර - 18 ඒ මිද්දරමුල්ල ග්‍රාම නිලධාරී වසම

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

ඓතිහාසික ඇබලව රහත් ගල්වෙහෙර ප්‍රදේශයට අයත් ගම්මානයකි. " මාකුඹුර " මේ නම මෙම ග්‍රාමයට ලැබී ඇත්තේ මහ කුඹුර යන අර්ථයෙනි. පෙර රජ දවස මෙහි සුවිශාලම කුඹුරු යායක් පැවති බවට තොරතුරු " ශ්‍රී ලංකා දීප වර්ණනා " නමැති කෘතියේ සඳහන් වේ. එකල සශ්‍රීකව තිබූ මහවෙල හෙවත් දැනට " මාකුඹුර " කියන විශාල කෙත ද කෝට්ටේ රාජධානි සමයේ හයවෙනි පැරකුම්බා රජු විසින් කොස්ගොඩ ගනේගොඩැල්ල රජ මහ විහාරයේ පැවිදිව සිටි තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් වෙනුවෙන් පූජා කල බව එහි සඳහන් වේ.
උතුරින් වැලිකන්ද ග්‍රාමය ද, නැගෙනහිරින් වැලිගොඩ මරදාන ග්‍රාමය ද, බස්නාහිරින් ගාල්ල - කොළඹ මාර්ගය ද, දකුණින් අඹගහපිටිය ග්‍රාමය ද අතීතයේ දී මෙම සුවිශාල වූ කුඹුරු යායේ සීමාවන් විය. ඉංග්‍රීසි පාලන අවදියේ දී පිහිටුවනු ලැබූ කොළඹ - මාතර මුහුදු බඩ මාර්ගය හේතුවෙන් "මිද්දරමුල්ල " ග්‍රාමය මෙම ප්‍රදේශයෙන් වෙන් වී ඇත.

දඹදෙණි සමයේ දකුණු සිරිලක පාලනය කල දේවපතිරාජ මහාමාත්‍යතුමාගේ ආහාර අතින් ප්‍රදේශය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ මුලින්ම මෙම කුඹුරුයාය අස්වද්දා ඇත. එදා සමස්ත වැලිතොට ප්‍රදේශයටම බත සැපයුවේ මෙම කුඹුරු යායෙනි. මෙම ප්‍රදේශයේ විධිමත් දියුණු වාරි මාර්ග පද්ධතියක් විය. යුරෝපීය ආක්‍රමණ හා සංහාරයන් නිසා වාරි මාර්ග පද්ධතිය විනාශ වූ අතර මෙම සුවිශාල වූ කුඹුරුයාය ගිණි රකුසාට බිලි කරනු ලැබීය. මෙසේ කාලයක් ගතවන විට මෙම කුඹුරුයාය ගොඩ කරමින් නිවාස ඉදිකිරීමට ජනතාව පෙළඹීණි. පුරාණයේ සශ්‍රීක කුඹුරුයාය කාලයාගේ ඇවෑමෙන් මෙසේ අස්වනු නොමැති " මහකුඹුර " බවට පත්වී පසුව "මාකුඹුර " නමින් ව්‍යවහාරව සමාජ ගත විය. මෙම කුඹුරේ කදිරගොන්න මායිමේ කොටසකට නිතර අඩදබර කරගත් හෙයින් එම කොටස "දබර කුඹුර" නමින් හැඳින්විය. එහෙත් දබර කුඹුර යන නම මේ වන විට භාවිතයෙන් ඉවත් වී එම කොටස ද කදිරගොන්න ග්‍රාම නිලධාරී වසමටම අයත් වී ඇත.

වැලිගොඩ කෝවිල පිහිටි ඉඩම පෞද්ගලික කුරුඳු ඉඩමකි. ඉඩම් නොමැති අවට ප්‍රදේශවාසීන් අනවසරයෙන් පදිංචි වීම නිසා ජනාවාසයක් විය. එම ප්‍රදේශය "කෝවිල වත්ත" නමින් හැඳින්වේ.

මෙම ප්‍රදේශයේ ජීවත් වූ එක් සුවිශේෂී ගැමි චරිතයක් පිළිබඳව තොරතුරු සඳහන් වේ. ධීවරයෙකු වශයෙන් දිවි ගෙවූ හේ "සැක්සීනු" නම් විය. හිටිවන කවි කීමට සමත්කමක් දක්වන ඔහු අළුයම බීලී පිත්තක් රැගෙන අහුන්ගල්ල වෙරළේ "ආදගල" වෙත ගොස් අල්ලා ගත් මාලු පසුම්බියක් රැගෙන ඇළඩින් වෙදමහතාගේ ගෙදරින් නෙල්ලි ස්ප්‍රීතු ටිකක් පානය කර රාජපක්ෂ මාවතෙන් මීගහ හන්දියට පිවිසෙන්නේ කවි කිහිපයක් ගායනා කරමිනි.

## <u>19 සී කදිරගොන්න</u>

**වසමේ පිහිටීම**

| | |
|---|---|
| උතුර | - 24 ගල්වෙහෙර ග්‍රාම නිලධාරි වසම |
| නැගෙනහිර | - මාදු ගඟ |
| දකුණ | - 20 ඒ පාතේගම්ගොඩ ග්‍රාම නිලධාරි වසම |
| බටහිර | - 19 බී මාකුඹුර ග්‍රාම නිලධාරි වසම |

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

දේව පතිරාජ අමාත්‍යවරයා විසින් මෙහෙය වන ලද යුද්ධයේ අශ්වයන් බලා ගන්නා අය හැඳින්වූයේ කදිරයන් ලෙසයි. ඔවුන් ගොනුවී සිටි ප්‍රදේශය "කදිරගොන්න" විය.

කදිරගොන්න ග්‍රාම නිලධාරී වසමට අයත් වන අම්පේ නම් ගමක් වේ. පැවති දුර්භික්ෂයක් දුරු කිරීමට දේවපතිරාජ ඇමතිතුමා පූජකවරු පිරිසක් දඹදිවින් කැඳවා ගෙනවිත් ශාන්තිකර්මයක් පවත්වා ඇත. එහිදී නොයෙකුත් පුද පූජා සිදු කර ඇති අතර 'අං ඇදීම' හා 'පොර පොල් ගැසීම' ආදී දේව පූජාවන් ද ඒ අතර විය. අං ඇදීමට පෙර දෙවියන් වෙනුවෙන් 'අං පේ' කිරීම කෙරිණි. එලෙසින් අං පේ කළ ප්‍රදේශය "අම්පේ" යන නමින් ප්‍රකට වූවා යැයි සඳහන් වේ.

**<u>20 බ්‍රාහ්මණවත්ත උතුර</u>**

**වසමේ පිහිටීම**

| | |
|---|---|
| උතුර | - 19 වැල්ලබඩ ග්‍රාම නිලධාරි වසම |
| නැගෙනහිර | - 21 ඒ වැලිවතුගොඩ සහ 21 ගල්මන්ගොඩ ග්‍රාම නිලධාරි වසම් |
| දකුණ | - 20 බී බ්‍රාහ්මණවත්ත දකුණ ග්‍රාම නිලධාරි වසම |
| බටහිර | - ඉන්දියන් සාගරය |

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

ශ්‍රී ලංකා ද්වීපයට භාරත දේශයේ සිට බ්‍රාහ්මණාගමනය සිදු වූයේ විජයාවතරණතෙක් ඇත ඉතිහාසයෙනි. සොලීන් හා ලංකාද්වීපය එක්සේසත් කළ "කීර්ති" නමින් හැඳින්වුණ පළමුවන විජයබාහු රජතුමා පුලස්ථ පුරවරයේ පැවති රාජාභිශේක මංගල්‍යය සඳහා උතුරු භාරතයේ උබය කුල පාරිශුද්ධ බ්‍රාහ්මණයන් පිරිසක් කැඳවාගෙන ඒමට පවරන ලද්දේ වෙළෙඳ නාවික කටයුතු සිදු කළ බේරුවල ගොරකාදූවේ විසූ පෙරියමරික්කාර් නම් මුස්ලිම් ජාතිකයාට බව "හෙළදිව බමුණු වත" ග්‍රන්ථයේ සඳහන් වේ. රුවල් නැවෙන් උත්තර භාරතයට ගිය හෙතෙම කෝසල රාජධානියේ සීමාවේ පිහිටි ශාලි ග්‍රාමයට ගොස් නන්බුදිරි, කප්පින, වීරසිංහ, වීරක්කොඩි, ඉදිරිමුණි, වලිමුණි හා එදිරිසිංහ යන සත් බමුණන් මෙරට කැඳවා ගෙනැවිත් රාජාභිශේකයෙන් පසු ගම්වර, වරප්‍රසාද පවරා දී ලංකාවේ පදිංචි කළ අතර සාලිගම බ්‍රහ්මණයන්ගේ වාසය බළපිටිය(පුරාණ වැලිතොට) බ්‍රහ්මණ වතුගොඩ බවට ඉතිහාස කතා සාධක හෙළි කරයි. මෙම බ්‍රහ්මණ වංශිකයින්ගේ නම් කේන්ද්‍ර කොට ගනිමින් වාසගම් සහිත පිරිසක් අද බ්‍රහ්මණවත්ත අවට ජීවත් වේ.

එසේම දන්ත කුමරු හා හේමමාලා කුමරිය යන දෙදෙනා බ්‍රහ්මණවාසීන් බවත්, ඔවුන් ලැඟුම්ගෙන සිටි පෙදෙස "බ්‍රහ්මණවත්ත" ලෙස ප්‍රසිද්ධ වූ බවත් සඳහන් වේ.දේව ඇදහීම් හා වත් පිළිවෙත් වලට අතීතයේ සිට ම ග්‍රාමීය ප්‍රජාව හුරු වී ඇත. දේව පතිරාජ ඇමති විසින් ආරම්භ කරන ලද පුරාණ මෝදර දේවාලය වන්දනාමාන කිරීම මෙන්ම භාරකාරීත්වයට ද බ්‍රහ්මණවත්ත ග්‍රාමීය ප්‍රජාව උරුමකම් කියති. අතීතයේ දී ධීවර ප්‍රජාව ජීවත් වූ අතර පුරාණයේ මසුන් ඇල්ලීමට භාවිත කරන ලද "ඔරු" නවතන ස්ථානය ඔරු වැල්ල නමින් අදත් හඳුන්වති. ජනප්‍රවාදයේ එන ඔරු, පාරු මුහුදු ගමනට පෙර භාර භාර වී වන්දමාන කරන ලද ස්ථානය බ්‍රහ්මණවත්ත පාරේ "දොඹ ගහ කෝවිල" නමින් අද පවතී.

**<u>20 ඒ පාතේගම්ගොඩ</u>**

**වසමේ පිහිටීම**

උතුර - 19 ඒ වතුරේගම ග්‍රාම නිලධාරි වසම
නැඟෙනහිර - මාදූ ගඟ
දකුණ - 21 ඒ වැලිවතුගොඩ ග්‍රාම නිලධාරි වසම
බටහිර - 19 වැල්ලබඩ ග්‍රාම නිලධාරී වසම

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

වැල්ලබඩට ආසන්නව පිහිටි පහත් බිම් ප්‍රදේශය ''පහත්ගම'' යනුවෙන් හඳුන්වා ඇති අතර පසුකාලයේ පහත්ගම යන්න ''පාතේගම'' ලෙස ව්‍යවහාර විය. පාතේගම කොට්ඨාසය දැනට ද අධික වැසි සහිත කාලයේදී විශාල භූමි ප්‍රමාණයක් ජලයෙන් යට වේ.

අමරපුර නිකායේ මූලස්ථානය වූ අඹගහපිටිය විහාරය සහ පෞරාණික වටිනාකමින් අනූන පුෂ්පාරාම විහාරය ඇතුළු විහාරස්ථාන 07ක් පාතෙගම්ගොඩ ග්‍රාම සේවා කොට්ඨාශයට අයත්වේ. තව ද ඔපිසර සංදේශය ලියූ හත්බෝධි විහාරයේ ශේෂ වී ගිය නටඹුන් පාතෙගම ගිනිගල්ගොඩ කන්දේ දැකිය හැකිය.

**<u>20 බී බ්‍රාහ්මණවත්ත දකුණ</u>**

**වසමේ පිහිටීම**

උතුර - මෝදර දේවාල පාර
නැගෙනහිර - ගාලු කොළඹ මහා මාර්ගය
දකුණ - රේගුව පාර සහ මාදූ ගඟ
බටහිර - ඉන්දියන් සාගරය

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

දකුණු ඉන්දියාවේ සාලි ග්‍රාමයෙන් රාජ්‍ය උදහසට ලක්ව නිරිත දිග වෙරළට පැමිණි බ්‍රාහ්මණ පිරිස පදිංචි වූ ස්ථානය බ්‍රාහ්මණවත්ත නමින් ප්‍රචලිත වූ බව ජනප්‍රවාදයේ එන්නකි.

ඉංග්‍රීසි පාලනයට නතුව තිබූ සමයේදී වෙළඳ භාණ්ඩ ප්‍රවාහන මධ්‍යස්ථානයක් ලෙස රේගුව පාර නැංගුරම් පල පිහිටි ස්ථානයේ රේල්ලුවක් පැවති බවත්, බ්‍රිතාන්‍ය පාලන සමයේ කුරුඳු ප්‍රවාහනය හා වෙනත් ප්‍රවාහනයට මෙම ස්ථානය යොදා ගත් බවත් වර්තමානයේදී රේගුව පාර යනුවෙන් ප්‍රචලිතව ඇත්තේ රේල්ලුව පැවති මාර්ගය බව ජනප්‍රවාදයේ සඳහන් වේ.

ඉංග්‍රීසි පාලන සමයේදී රේල්ලුව ආශ්‍රිතව රෝමානු කතෝලික පල්ලිය ඉදි වූ බව ඉතිහාස කතාවල සඳහන් වේ.

II වන පරාක්‍රමබාහු රජ දවස දේව පතිරාජ ඇමති සේනාංක රැස් කිරීමට වැලිතොට ග්‍රාමය යොදා ගත් අතර දේවභක්තිය හා මිනිසුන්ගේ ඇදහීම් හා වත් පිළිවෙත් තුළ තිබූ දේව සංකල්පය ව්‍යාප්ත කිරීමට ආරම්භ කළ දේවාලයක් ලෙස බළපිටිය පුරාණ මෝදර දේවාලය ඉදිකරන ලද බව ජනප්‍රවාදයේ එන්නකි. මෝදර දේවාලය දඹදෙණි යුගය දක්වා ඉතිහාසයක් ඇති ස්ථානයකි.

1933 වකවානු වල බෞද්ධ ශාසනික උපසම්පදා කටයුතු ආරම්භ කිරීමත් සමඟ දේවාල පාර ශ්‍රී සුගතාරාම විහාරස්ථානය ඉදි වූ බව සඳහන් වේ.

**<u>21 ගල්මංගොඩ</u>**

**වසමේ පිහිටීම**

උතුර - රේවත මාර්ගය
නැගෙනහිර - මාදූ ගඟ
දකුණ - දුම්රිය මාර්ගය
බටහිර - ගාලු කොළඹ මහා මාර්ගය

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

ශ්‍රී ලංකා භූමියේ දකුණු පළාතේ ගාලු දිස්ත්‍රික්කයේ බළපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල ඇති අංක 21 ගල්මන්ගොඩ වසම පිහිටා ඇති අතර එම ගල්මන්ගොඩ නාමය කෙසේ සෑදුම්ලත් ද යන්න ජන බස් වහරේ මෙසේ සඳහන් වේ.

ගිරා සන්දේශයට අනුව ගල්මන්දූවේ සිටින ජනතාව වැලිතරට පැමිණ ඇත්තේ ගල් ඒදණ්ඩක් ඔස්සේය.එවකට පරාක්‍රමබාහු රජු දවස දේව පතිරාජ ඇමතිවරයා විසින් ගල් ඒදණ්ඩකින් පැමිණි හෙයින් ගලින් සැදුනු නිසා ගල් මන් මාර්ගයෙන් ගොඩවුනු නිසා ගල්මන්ගොඩ යන නාමයෙන් එදා පටන් අදවන තුරු හදුන්වනු ලැබේ.

**<u>21 ඒ වැලිවතුගොඩ</u>**

**වසමේ පිහිටීම**

උතුර -20 ඒ පාතෙගම්ගොඩ ග්‍රාම නිලධාරි වසම
දකුණ - 21 ගල්මන්ගොඩ ග්‍රාම නිලධාරි වසම
නැගෙනහිර - මාදූ ගඟ
බටහිර - 20 බ්‍රාහ්මණවත්ත උතුර ග්‍රාම නිලධාරි වසම

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

වැලිවතුගොඩ නමින් හඳුන්වන ග්‍රාම නිලධාරී වසම මුල් කාලයේදී හඳුන්වා තිබුනේ වැලිතොට නමිනි. 1215 වර්ෂයේදී දේවපතිරාජ ඇමතිතුමා විසින් වැලිවත්ත පුරාණ පත්තිනි දේවාලය සකස් කර ස්ථාපිත කර වූ පසු වැලිවත්ත යන නාමයෙන් එය මුල් බැස ගන්නා ලදි. සුදු මරදාන් වැල්ලෙන් මෙම භූමිය සෑදී ඇති නිසා එම වැලිවත්ත යන නම එසේ යොදා ගනු ලැබ ඇත. පසුව වසම් බෙදන විට වැලිවතුගොඩ යන නාමයෙන් මෙම ග්‍රාම නිලධාරී කොට්ඨාසය නම් කර ඇත.

**<u>21 බී හීනටිය උතුර</u>**

**වසමේ පිහිටීම**

උතුර - මාදූ නදී තීරය
නැගෙනහිර - මාදූ නදී තීරය
බටහිර - බළපිටිය වතුගෙදර C1 මාර්ගය
දකුණ - බළපිටිය වතුගෙදර C1 මාර්ගය

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

අතීතයේ හීනටි නැමැති සහලින් ස්වයංපෝෂිත ප්‍රදේශයක් බැවින් මෙම ප්‍රදේශයට හීනටිය නැමැති නාමය ලැබී ඇත.

**<u>21 සී හීනටිය දකුණ</u>**

**වසමේ පිහිටීම**

| | |
|---|---|
| උතුර | - 87 බී ආඳාදොළ ග්‍රාම නිලධාරී වසම |
| නැගෙනහිර | - 90 වඳදූව ග්‍රාම නිලධාරී වසම |
| දකුණ | - 21 බී හීනටිය උතුර ග්‍රාම නිලධාරී වසම |
| බටහිර | - 87 ඩී සීනිගොඩ ග්‍රාම නිලධාරී වසම |

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

"හීනටි" නම් සහලෙන් ස්වයං පෝෂිත වූ ග්‍රාමයක් නිසා හීනටිය නම් නාමය ලැබුණු බව ජනප්‍රවාදයේ සඳහන් වෙයි. පරිපාලන පහසුව සඳහා හීනටිය උතුර සහ දකුණ ලෙස ග්‍රාම නිලධාරී වසම් දෙකකට බෙදා ඇත.

**<u>21 ඩී මහලදූව</u>**

**වසමේ පිහිටීම හා භූමි ප්‍රමාණය**

| | |
|---|---|
| උතුර | - මාදූ ගඟ |
| නැගෙනහිර | - මාදූ ගඟ |
| දකුණ | - 21 බී හීනටිය උතුර ග්‍රාම නිලධාරී වසම |
| බටහිර | - මාදූ ගඟ |

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

ඓතිහාසික මූලාශ්‍ර පෙන්වා දෙන පරිදි මාදූ ගඟ දූපත් 64කින් සමන්විත වූ රමණීය ගංගාවකි. භූමි ඛාදනය හා ජල මට්ටමේ ඉහළ යාම නිසා වර්තමානයේ දැකිය හැක්කේ දූපත් 15කි. අනෙක් දූපත් කාලයක් සමඟ විනාශ වී ගොස් ඇත. ඉතිරි වී පවතින දූපත් අතරින් එක් දූපතක් ලෙස මහලදූව පෙන්වා දිය හැක. මීට අවුරුදු 120කට පමණ පෙර මහල් නිවාස 15ක් පමණ තිබූ බව ජනප්‍රවාදයේ සඳහන් වේ. එම නිසා මහල්දූව වර්තමානයේ මහලදූව ලෙස ඇති වී තිබේ. එම මහල් ගෙවල් සොල්දර සහිත එක ම ආකාරයේ කැටයම් සහිත ව තිබී ඇත. අතීතයේ ප්‍රධාන බෝගය කුරුඳු වගාව වූ අතර නිවාස ව්‍යාප්තිය නිසා ඉඩම් කුඩා කැබලි තත්ත්වයට පත් ව තිබේ. මහලදූව විහාස්ථානයක් මෙන් ම පැරණි කෝවිලක් ද තිබේ. එය දේවපතිරාජ අමාත්‍යවරයා විසින් ඉදි කළ බවට ජනප්‍රවාදයේ සඳහන් වේ.

**<u>21 ඊ ඇළතොට</u>**

**වසමේ පිහිටීම**

| | |
|---|---|
| උතුර | - කොල්වින් ආර් ද සිල්වා මාවත |
| නැගෙනහිර | - මාදූ ගඟ |
| දකුණ | - මාදූ ගඟ |
| බටහිර | - ගාල්ල - කොළඹ ප්‍රධාන මාර්ගය |

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

අතීතයේ වැලිතොට නමින් හැඳින්වූ බළපිටියට අයත් ඇළතොට ග්‍රාම සේවා වසමේ ඉතිහාසය දඹදෙණි යුගය දක්වා දිව යයි. දෙවන පරාක්‍රමබාහු රජ සමයේ මෙම ප්‍රදේශය භාරව කටයුතු කලේ දේවපතිරාජ ඇමතිතුමාය. අතීතයේ ඇළතොට පාතමුල්ල මුල්ලේගෙදර නමින් හැඳින්විය. මෙම ගමෙහි එක්

මායිමක් මාදූ ගංඟාව වන අතර, ගම්වාසීන් ඔවුන්ගේ ගමන් බිමන් පහසුව හා කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රවාහනය සඳහා මාදූ ගඟට සම්බන්ධ වන ලෙස ඇළ මාර්ගයක් සකස් කර ඇත. මෙම ඇළ නිසා මෙ ගම "ඇළතොට"යනුවෙන් හඳුන්වන අතර එහි තවත් පැත්තක් පහත් බිමක්ව පැවති අතර අද ද එම ප්‍රදේශය ජලයෙන් යට වේ. එම ප්‍රදේශය පහත් බිම වීම නිසා "පාතමුල්ල" යනුවෙන් හඳුන්වයි.

## 22 වැලිතර

**වසමේ පිහිටීම**

බ්‍රාහ්මණවත්ත උතුර,බ්‍රාහ්මණවත්ත දකුණ, ඇළතොට, ගල්මන්ගොඩ හා වැලිවතුගොඩ යන ග්‍රාම සේවා වසම් පහක ජීවත්වන මුස්ලිම් ප්‍රජාව පමණක් නියෝජනය වන පරිදි මෙම වැලිතර වසම පිහිටා ඇත. නිශ්චිත ප්‍රදේශයක් නොමැත.

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

අතීතයේ සිට බලපිටියේ ජීවත් වූ මුස්ලිම්වරු ගාලු පාර මුහුදු වෙරල ආශ්‍රිතව වැලිතොට නමින් හඳුන්වන ප්‍රදේශයට වැලිතර නාමය භාවිතා කොට නිශ්චිත භූමියකින් තොරව බලපිටියේ විවිධ ස්ථානවල පදිංචිවී සිට ඇත. පරිපාලනයේ පහසුව සඳහා ඔවුන් පදිංචිව සිටින කොට්ඨාස පහ එකතුකොට ගෙන අංක 22 දරන වැලිතර ග්‍රාම නිළධාරී වසම බිහිවී ඇත.

## 23 මාදූව

**වසමේ පිහිටීම**

මාදූ ගඟට මැදිව පිහිටි දූපතකි.

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

මාදූ ගඟේ පිහිටි දූපත් අතරින් විශාල ම දූපත වීම නිසා "මහා දූව" ලෙස හඳුන්වා ඇති අතර පසුව "මාදූව" ලෙස උච්චාරණය වී ඇත.

## 24 ගල්වෙහෙර

**වසමේ පිහිටීම**

| | |
|---|---|
| උතුර | - අහුන්ගල්ල -ඌරගහ මාර්ගය |
| නැගෙනහිර | - කරිජ්ජපිටිය ඇළ |
| දකුණ | - 19 සී කදිරගොන්න ග්‍රාම නිලධාරි වසම |
| බටහිර | - අහුන්ගල්ල දුම්රිය මාර්ගය |

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

ගල්වෙහෙර ගම ඉපැරණි ගම්මානයකි. දෙවන පැතිස් රජ දවස දක්වා මෙම ගම්මානයේ ඉතිහාසය ඇදී යයි. දෙතිස් ඵල රුහ බෝධීන් වහන්සේ ඇඹලව රහත් ගල්වෙහෙර රෝපණය කරන ලද බව සිංහල බෝධි වංශයේ සඳහන් වේ. ගෝඨාභය රජතුමා විසින් කරවන ලද ඓතිහාසික මළුව රජමහා විහාරය

පිහිටියේ ද ගල්වෙහෙර ගම්මානයේ ය. ගලින් නිමවන ලද ගල් ආශ්‍රිත පෙදෙසක වෙහෙරක් කරවා තිබූ හෙයින් ''ගල්වෙහෙර'' නමින් හඳුන්වන්නට වූ බව ඉතිහාසයේ සඳහන් වෙයි.

මුල් අවධියේ කළුගල්වලින් තනන ලද චෛත්‍යයක් නිසා ගල්වෙහෙර ''සේල චේතිය'' නමින් ප්‍රසිද්ධ වී ඇති බවත් පාලි භාෂාවෙන් ''සේල චේතිය'' යන වචනය සිංහලට පරිවර්තනය කළ විට ''ගල්වෙහෙර'' නමින් ප්‍රසිද්ධ වී ඇති බවත් ''රුහුණු පුදබිම'' ග්‍රන්ථයේ සඳහන් වේ. පුරාණ ඇඹලව රහත් ගල්වෙහෙර නාමය ක්‍රමයෙන් අනිත්‍ය වශයෙන් ජරාවට ගොස් ගත් වහරෙහි ගල්වෙහෙර'' කියාද කට වහරෙහි ගල්හෙර කියාද ව්‍යවහාර වන බව ''විශ්වයේ මහත් ඔබත්'' ග්‍රන්ථයේ සඳහන් වේ.

ගල්වෙහෙර නාමය නිපන් ආකාරය, විමල් අබේසුන්දර කවියාගේ කවි සංකල්පනාවට බඳුන් වූයේ මේ අයුරෙනි.

බුදු සසුනුයන මැද වැලිතොට තෝතැන්නේ
සුපිපුණ දෑ සමන් මල් ගොමුවන් වැන්නේ
වැන සී ගියත් අව්වේ වැස්සේ පින්නේ
''ගල්වෙහෙරමයි'' ගල්වෙහෙරට නම දුන්නේ

ඒ අනුව ගලින් නිමවන ලද හෝ ගල් සහිත බිමක ඉදි කළ චෛත්‍යයක්, භික්ෂූන් වසන ආරාමයක් හෝ පිළිම ගෙයක් තිබූ ස්ථානය මුල් කොට මෙම පෙදෙස ''ගල්වෙහෙර'' වශයෙන් නම් කරන්නට ඇත. එවැනි බිමක් වර්තමාන ගල්වෙහෙර ග්‍රාම නිලධාරී වසම තුළින් හමු වේ. ගල් සහිත බිමක විහාරයක් ඉදි කර තිබූ බවට සාක්ෂි සුලභව දැකිය හැකි එම ස්ථානය කොත්දූ වෙහෙරට උතුරු දෙසින් මාදු නදී තෙර, වර්තමාන සී.පී.ද සිල්වා මාවතට මායිම්ව, කුඩා කඳු ගැටයක් සහිත නෙත් සිත් ඇද ගන්නා සුළු මනරම් භූමි භාගයක පිහිටා ඇත. මෙම විහාර භූමියේ ඉපැරණි ගල්කණු, ගල්කණු මුල් ඇතුළු පාෂාණමය මෙවලම් රාශියක් දැකිය හැකිය. වර්තමානයේ මළුව පන්සල නමින් හැඳින්වෙන මෙම පිංබිම පුරාණයේ ''ඇඹලව රහත් ගල්වෙහෙර, වාලුකා තිත්ථ විහාරය, සල්ගමු වෙහෙර, පතිරාජ වෙහෙර, සේල චේතිය වශයෙන් හැඳින්වෙන බවට විවිධ මත ඉදිරිපත් වී ඇත.

පුලිනතලාරාමය විහාරස්ථානයේ පිහිටි ''වලේ කෝවිල'' සඳහා දේවපතිරාජ ඇමැතිතුමා විසින් පොකුණක් කර වන ලදි. එහි වතුර බැබිල මලේ පැහැය හා සමාන වූයෙන් ''බැබිලමල් පොකුණ'' ලෙස හඳුන්වා ඇත.

ගල්වෙහෙර මංසන්ධිය ''මී ගහ හන්දිය'' යයි. පෙරදී විශාල මී ගසක් තිබූ නිසා මී ගහ හන්දිය ලෙසින් ව්‍යවහාර වී ඇත.

## <u>24 ඒ පොල්අතුපළාත</u>

**වසමේ පිහිටීම**

උතුර - කොස්ගොඩ ඌරගහ මාර්ගය
නැගෙනහිර - මළකුණාව ඇළ
දකුණ - මාගල ඇළ සහ මාදු ගඟ
බටහිර - හොරඩුව ඇළ

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

කටුවිල ආසන්නයේ පිහිටියේ පොල්අතු පළාත හෙවත් පොල්අතුකන්ද ය. පොල්අතුපළාත ග්‍රාමය ඓතිහාසික පසුබිමක් ඇති ප්‍රදේශයකි. IV වන පරාක්‍රමබාහු රජ සමයේදි දේව පතිරාජ ඇමතිවරයා යටතේ මෙම ප්‍රදේශය පැවතුන බවත්, පොල්අතුපළාත ගමට ඊසාන දෙසට වන්නට පිහිටි යුධ පිටිය ගම් ප්‍රදේශයේ බල කදවුරු පිහිටා තිබූ බවක් සදහන් වේ. අතීතයේදී මෙම ප්‍රදේශයට සතුරු ආක්‍රමණ එල්ල වූ අතර පොල්අතුපළාතේ කඳු මුදුන්වල සිට ඔත්තුකරුවන් ඔත්තු බැලූ බව සදහන් වේ. කන්දේ සිටි අය කඳවුරු සමග කොඩි මගින් පණිවුඩ හුවමාරු කර ගත් බැවින් මෙම කන්ද කොඩිගහ කන්ද ලෙස හඳුන්වා ඇත.

දේවපතිරාජ ඇමතිතුමාගේ මාලිගය පොල්අතු කන්දේ තිබූ බවත්, එතුමා විසින් මේ ප්‍රදේශයේ පොල් වගා කළ හෙයින් පොල්වතු පළාත යනුවෙන් හඳුන්වා ඇති බවත් කියැවේ. පසු කාලයේදී පොල්අතු පළාත නමින් ව්‍යවහාරයට එකතු වී තිබේ. මාදූ ගඟේ ආරම්භය සිදු වන්නේ ද පොල්අතු කන්දෙන් බව කියැවේ. එදා එම ප්‍රදේශය සුප්‍රසිද්ධ ඔරු හා පාරු තොටුපළකි. අවට ප්‍රදේශවලට අවශ්‍ය කරන පොල් අතු, දර හා පොල් කොළ ආදිය මෙම තොටුපළෙන් ප්‍රවාහනය කිරීම නිසා "පොල්අතු පළාත" යනුවෙන් ප්‍රචලිත වූ බව ජනවහරේ පවතින තවත් මතයකි. මෙහි ඉඩම් බොහොමයක් රජයට අයත් අතර වී හා කුරුඳු ප්‍රධාන බෝග ලෙස වගා කරනු ලබයි.

## <u>24 කටුවිල</u>

**වසමේ පිහිටීම**

| | |
|---|---|
| උතුර | - 24 ඒ පොල්අතුපළාත ග්‍රා.නි.වසම හා 24 ඩී පතිරාජපෙදෙස ග්‍රා.නි. වසම |
| නැගෙනහිර | - මාදූ ගඟ |
| දකුණ | - 17 ඩී මහපිටිය ග්‍රා.නි.වසම |
| බටහිර | - කරිජ්ජපිටිය ඇළ |

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

IV වන පරාක්‍රමබාහු රජ සමයේ දී දේව පතිරාජ ඇමතිවරයා යටතේ මෙම ප්‍රදේශය පැවතුනි. මෙම ප්‍රදේශයේ පහත් බිම්, කටුපදුරු, ලැහැබි වලින් යුක්ත විය. මෙම ප්‍රදේශය එම සමයේ සහලින් ස්වයංපෝෂිත කිරීමේ සංකල්පය අනුව වී ගොවිතැන සඳහා පහත් බිම් යොදා ගනිතියි කටු පඳුරු ආශ්‍රිත වෙල්යායක් වූ බැවින් මෙම ප්‍රදේශය කටුවෙල වශයෙන් හැඳින්වෙයි. පසුකාලීනව මෙම නාමය කටුවිල ලෙස වෙනස් විය.

කරිජ්ජපිටිය වෙල් යාය අස්වැද්දීම සඳහා ගල්වෙහෙර ගම මැදින් දේවපතිරාජ ඇමතිතුමා විසින් ඇළක් තනවන ලදි. එම ඇළේ වේල්ලෙන් එගොඩ ප්‍රදේශය "වේල්ලගොඩ" නමින් ව්‍යවහාර විය. එය මෙම වසමට අයත් ගම්මානයකි.

මුල් කාලයේදී මෙම ග්‍රාම පෙදෙස අයත්ව තිබුනේ පිට කැලේ ප්‍රදේශයට ය. පසුව පිටකැලේ පොල්අතුපලාත බවට නම වෙනස් වීමෙන් අමතරව කටුවිල ග්‍රාමය එම ප්‍රදේශයේ සීමාවට ඇතුලත් විය.

පසුකාලීනව අංක 24 ගල්වෙහෙර ග්‍රාමසේවා වසමට ඇතුලත් වූ මෙම ග්‍රාමය අද වන විට අංක 24බී කටුවිල යනුවෙන් වෙනම ම ග්‍රාම නිලධාරී කොට්ඨාශයක් බවට පත්විය.

එමෙන්ම මෙම ග්‍රාම නිලධාරී වසම තුළ සුවිශාල ලෙස කුරුඳු වගාව අද වනවිට බිහිවී ඇත. ඊට අමතරව රබර් වගාව හා පොල් වගාව ද ව්‍යාප්ත විය.

24බී කටුවිල ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ සංස්කෘතික පසුබිම පිළිබඳ සාකච්ඡා කිරීමේ දී බෞද්ධ පරිසරයෙන් හෙබි සංස්කෘතියක් බිහිවී පවතී. වසමේ පිහිටා ඇති ආගමික ස්ථාන වන ආනන්දාරාමය සහ ධර්මාරාම විහාරය යන විහාරස්ථාන වේ. ධර්මාරාම විහාරයේ මේ වන විට මෛත්‍රී දහම් පාසල ගමේ දරුවන් වෙනුවෙන් මීයාගල නිමල මෛත්‍රී හිමියන් ඇතුළු ගම්වාසීන් විසින් පවත්වා ගෙන යනු ලබයි. මෙම ග්‍රාමයේ කුරුඳු කර්මාන්තය ආශ්‍රිත රැකියා මත වැඩි පවුල් සංඛ්‍යාවක් ජීවත් වේ. මේ වනවිට කුරුඳු වතු ආශ්‍රිතව රැකියා වල නියැලීමට පැමිණි දමිල පවුල් කිහිපයක් ද මෙම ග්‍රාමය තුල දක්නට ලැබේ.

## <u>24 සී බෝගහපිටිය</u>

### වසමේ පිහිටීම

උතුර - කිරිල්ල ඇළ
නැගෙනහිර - කිරිල්ල ඇළ
දකුණ -අහුන්ගල්ල ඌරගහ පිවිසුම් මාර්ගය
බටහිර - අහුන්ගල්ල දුම්රිය මාර්ගය

### වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම

බෝග වගා කරන ලද පෙදෙස බෝග වගා පිටිය විය. කැකිරි, මුං, කෙසෙල් ආදිය මේ අවට වගා කර ඇති අතර කරිජ්ජපිටිය වෙල් යායෙහි වී වගා කර තිබේ. එබැවින් මෙම ගම "බෝගහපිටිය" ලෙසින් නම් වූ බව කියැවෙයි. තවත් මතයක් වන්නේ මෙහි පිහිටි ඉපැරණි බෝධි වෘක්ෂයක් පාදක කර ගනිමින් බෝගහපිටිය නම් වූ බවයි. ශ්‍රී විජය බෝධිරාජාරාම භූමිය තුළ පිහිටි මෙම බෝධීන් වහන්සේ අෂ්ඨඵල බෝධීන් වහන්සේ නමකින් පැවත එන බව පැවසේ.

බෝගහපිටියේ නැගෙනහිරට මායිම් වූ සුවිශාල කරිජ්ජපිටිය වෙල් යායෙන් එගොඩ පිහිටි ගම "විලේගොඩ" විය. වෙල් යායෙන් එගොඩ "වෙලේ ගොඩ" වී පසුව උච්චාරණ පහසුව සඳහා පැරැන්නන් "විලේගොඩ" යනුවෙන් ව්‍යවහාර කර ඇත.

බෝගහපිටිය වසමට අයත් වන ලෝකන්වත්ත ග්‍රාමය ප්‍රදේශයේ ඓතිහාසිකත්වය විදහා දක්වන තවත් ගම්මානයකි. ලෝකන්වත්ත ගම්මානයට එම නම ලැබුණු ආකාරය ජනප්‍රවාදයේ සඳහන් වන ආකාරයට ලොකු කෙසෙල් කැන් එලදාවක් තිබූ නිසා මෙම ග්‍රාමය ලොකු කැන් වත්ත වී, පසුව ලෝකන්වත්ත වූ බවයි. නමුත් සත්‍ය වශයෙන්ම ග්‍රාම නාම සංයුතියට අනුව මෙම ග්‍රාමයට එම නම ලැබී ඇත්තේ ලෝහ * කම්* වත්ත යන වචන ඒකරාශී වීමෙනි. ලෝහ කර්මාන්තය තිබූ පෙදෙස යන අර්ථය එයට ඇති හොඳම උදාහරණයයි. මෙම ප්‍රදේශයේ ඓතිහාසිකත්වය විමර්ශනය කිරීමෙන් මේ පිළිබඳ සත්‍ය අවබෝධ කර ගත හැකිය. අනුරාධපුර රාජධානි සමයේ දී දෙවන පැතිස් රජ දවස ජය ශ්‍රී මහ

බෝධීන් වහන්සේගෙන් පහළ වූ දෙතිස් එල රුක බෝධීන් වහන්සේලා ලක්දිව තැනින් තැන රෝපණය කිරීමේදී එම බෝධීන් වහන්සේලාට වතාවත් කිරීමට අටලොස් කුල ශිල්පීන් සම්බන්ධ වූ බව තොරතුරු සනාත වී ඇත. එම ශිල්පීන්ගෙන් බෝධීන් වහන්සේගේ පූජාවට, රන්රිදී කැටපත් හා ලෝහ භාණ්ඩ සැපයීමට දායක වූ ලෝකුරු කුලයේ පිවිසුම් ගත් පෙදෙස ලොහකම් වත්ත වූ බව ඓතිහාසික මතයකි. දඹදෙණි රාජධානි සමයේ දකුණු සිරිලක පාලනය කළ දේවපතිරාජ මහා අමාත්‍යවරයාගේ සුවිසි ලක්ෂ පස් විසි දහසක් වූ අගම්පඩි හමුදාවට අවශ්‍ය අවි තැනීමට ලෝහ නිර්මාණය කළ කම්හල තිබූ පෙදෙසම බව අනෙක් ඓතිහාසික මතයයි. මේ මත දෙක අනුව නිගමනය කළ හැක්කේ මෙම ග්‍රාමය ලොහකම්වත්ත යැයි අරුත් ගැන්වීමට මෙම කරුණු හේතු සාධක වූ බවයි. "ලොහොකම් වත්ත" පසු කලෙක "ලෝකන්වත්ත" ලෙස සමාජගත වී ඇත.

කෙසෙල් හඳුන්වන තවත් නමක් වූයේ “කදල” ය. කෙසෙල් වගා කළ ප්‍රදේශය කදලපිටිය නමින් හඳුන්වා තිබේ. තවත් මතයක් වන්නේ ක්‍රි.ව 1258 දී චන්ද්‍රභානු සෙනවියා යටතේ ලංකාව අක්‍රමණය කළ කේරළ හමුදාව දේව පතිරාජ අමාත්‍යවරයා ප්‍රධාන සිංහල හමුදාව විසින් වැලිතොට මුවදොර දී සමූල ඝාතනය කළ බව ඓතිහාසික සාධක වලින් පැහැදිලි වේ. එම සටනේදී මළ කේරළ භටයන්ගේ හිස සුන් මළ කඳන් දැමූ ස්ථානය " කඳන් ලූ පිටිය " වශයෙන් අර්ථ ගැන්වීය. පසුව "කදලපිටිය" බවට පත් වී ඇත.

දඹදෙනි රාජධානි සමයේදී දකුණු ප්‍රදේශය පාලනය කළ දේව පතිරාජ මහා අමාත්‍යවරයාගේ, අහරින් රට ස්වයංපෝෂිත කිරීමේ වැඩසටහන මෙම ප්‍රදේශය තුල ද ක්‍රියාත්මක කරනු ලැබීය. ගම සංවර්ධන කටයුතු සඳහා තෝරාගනු ලැබුවේ තැනිතලා පහත් බිමක් වූ මෙම ප්‍රදේශයයි. ජල පහසුකම් ඇති මෙම පෙදෙස එම කාර්යය සඳහා සුදුසු ම භූමිය විය. මෙහි සුවිශාල තණ බිමක් ද විය. මෙහි ආරම්භ කළ ගව සංවර්ධන කටයුතු ඉතා සාර්ථක වූ අතර කිරි නිෂ්පාදනය ද ඉතා උසස් මට්ටමක පැවතිණි. කිරිවලින් රට ස්වයං පෝෂිත කිරීමට දායක වූ මෙම පෙදෙස "කිරවල වත්ත" පසුව "කිරවලා වත්ත" වශයෙන් ව්‍යවහාර වී සමාජගත විය. පුරාණයේ වැලි කඳු ආශ්‍රිත බිමක් වූ හෙයින් වැලිකන්ද ප්‍රදේශයට එම නම ලැබී ඇත.

## 24 ඩී පතිරාජපෙදෙස

**වසමේ පිහිටීම**

| | |
|---|---|
| උතුර | - 16 සී බොරළුකැටිය ග්‍රා.නි.වසම |
| නැගෙනහිර | - මලකුණාව ඇළ |
| දකුණ | - 24 ඒ පොල්අතුපළාත ග්‍රා.නි.වසම |
| බටහිර | - 24 බී කටුවිල ග්‍රා.නි.වසම |

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

දඹදෙණි රාජධානි සමයේ දකුණු සිරිලක පාලන කල දේවපතිරාජ අමාත්‍යවරයා විසින් මෙම ප්‍රදේශයට කරන සුවිසල් මෙහෙය වෙනුවෙන් එතුමාට කරන ගෞරවයක් වශයෙන් මෙම ග්‍රාමය පතිරාජ පෙදෙස වශයෙන් නම් කර ඇත.

1950 දශකයේ මෙම ප්‍රදේශය වන වදුලකි. පොල්අතුකන්ද ආශ්‍රිතව පිහිටි හෙයින් රජය සතු රක්ෂිත වනාන්තරයක 1950 දශකයේ දී පැවති රජය විසින් මෙම වනගත ප්‍රදේශය වගාකිරීම සඳහා ඉඩම් නොමැති ජනතාවට බෙදා දෙන ලදි. පසුව මෙය ජනාවාසයක් බවට පත් වූ අතර මේ වන විට කුරුඳු වගාවෙන් පිරුණු සරුසාර ග්‍රාමයක් බවට පත්ව ඇත.

අහුන්ගල්ල පුරාණ ක්ෂෙත්‍රාරාම විහාරධිපතිව වැඩසිටි අතිපූජ්‍ය අහුන්ගල්ලේ ආරියවංශ නාහිමියන් විසින් මෙම ග්‍රාමයේ පොල්අතුමඩුවකින් ආරම්භ කරන ලද කණිෂ්ඨ විද්‍යාලය අද පතිරාජ පෙදෙස මහා විද්‍යාලය නමින් මහා විද්‍යාලයක් දක්වා සංවර්ධන ය වී ඇත.

මෙම ග්‍රාම නිලධාරි වසමට අයත් පොල් අතු කන්දට උතුරු දෙසින් පිහිටි සුන්දර කඳු ගැටයක් වූ කඩවර කන්ද පාදක කරගෙන පිහිටි ගම්මානයකි. දේවපතිරාජ ඇමතිතුමා කඩවර දෙවියන් සඳහා පුද පූජා පැවැත්වීමට මෙම කඳු මස්තකය යොදා ගැනීම නිසා කඩවර කන්ද වශයෙන් සමාජ ගත වී තිබේ.

මෙම ග්‍රාම නිලධාරී වසම මේ වන විට පන්සල් තුනකින් ද පාසලකින් ද රාජ්‍ය ආයතන දෙකකින් ද සමන්විතව ඇත. වර්ග කිලෝමීටර 1.23 කින් සමන්විත මෙම ග්‍රාමයේ කුරුඳු, කුඹුරු මිශ්‍ර බෝග වලින් සමන්විත සුන්දර මිනිසුන්ගෙන් සමන්විත වූ සුන්දර ගම් පියසකි.

**<u>24 ඊ පතිරාජගම</u>**

**වසමේ පිහිටීම**

| | |
|---|---|
| උතුර | - 24 බී කටුවිල ග්‍රාම නිලධාරි වසම |
| නැගෙනහිර | - 24 බී කටුවිල ග්‍රාම නිලධාරි වසම |
| දකුණ | - 24 ගල්වෙහෙර ග්‍රාම නිලධාරි වසම හා මාදු ගඟ |
| බටහිර | - 24 බී කටුවිල ග්‍රාම නිලධාරි වසම |

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

මෙය ජනාවාස වීම පොලොන්නරු යුගයේ මහ විජයබාහු රජ දවස බව ජනශ්‍රැතිවල සඳහන්වේ. රජුගේ රාජාභිෂේකය සඳහා සහභාගී වූ උතුරු භාරත ශාලිග්‍රාම බ්‍රාහ්මණයන්ගේ සම්ප්‍රාප්තියත් සමඟ මොවුන්ගේ ආගමන සිදුව ඇත. (මූලාශ්‍ර - හෙළදිව බමුණු වත) දේව පතිරාජ මහාමාත්‍යවරයාගේ නෙල්ලි උයන ද මෙහි පිහිටි බව ජනශ්‍රැතිය දක්වයි. එමෙන්ම දේවපතිරාජ ඇමති විසින් කර්මාන්ත නගා සිටුවීමේ වැඩපිළිවෙළීදි මැටිබඳුන් නිපදවීමේ කාර්ය සඳහා මෙම ගම යොදා ගෙන ඇතත් පසුව ගම්වැසියන් ඉන් පෙදරේරු වෘත්තියට මාරු වී ඇත.

1970දී බලයට පත් සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනියගේ රජයේ බළපිටිය පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වූ පී.ඩී.වීරසිංහ ද සිල්වා මහතා විසින් සමූහ ගොවිපොළක් පිහිටුවීමේ අරමුණින් අක්කර හතළිස් පහකින් යුතු ‘‘කසගහවත්ත’’ නැමැති ඉඩම රජයට පවරා ගන්නා ලදි. සුවිශාල කස ගහක් තිබූ හෙයින් මෙම ඉඩම ‘‘කසගහවත්ත’’ විය.

1977 දී සමගි පෙරමුණු රජය පරාජය වීමත් සමඟ ම සමූහ ගොවිපොළ ව්‍යාපාරය ද අකර්මන්‍ය විය. අග්‍රාමාත්‍ය ආර්.ප්‍රේමදාස මහතාගේ උදාගම් සංකල්පය යටතේ මෙම භූමියේ උදා ගමක් පිහිට වූයේ

නීතිඥ ආර්.පල්ලෙවෙල මහතා ඉරිදා ලංකාදීප පුවත්පතට ලියන ලද ලිපියකට ප්‍රේමදාස මහතාගේ අවධානය යොමු වීම නිසාවෙනි. බළපිටිය පාර්ලිමේන්තු මන්ත්‍රී හා නියෝජ්‍ය කතානායක නෝමන් වෛද්‍යරත්න මහතාගේ නිර්දේශය මත ඉදි වී 1986 දෙසැම්බර් දාහතර වන දින විවෘත කරන ලද උදාගම ''පතිරාජගම'' යනුවෙන් නම් කළේ ද දේවපතිරාජ ඇමතිතුමාට කෙරෙන උපහාරයක් ලෙසිනි.

මෙම ග්‍රාමය ඉතිහාසය අනුරපුර යුගය දක්වා දිවයයි. ඓතිහාසික ඇඹලව රහත් ගල්වෙහෙර ග්‍රාමයේ ''ඇඹලව ග්‍රාම'' නමින් ගමක් ව්‍යවහාර විය. ඇඹලව යනු නෙල්ලි බැවින් නෙල්ලි වෘක්ෂ සමූහයක් පිහිටි ප්‍රදේශය ''නෙල්ලිගොඩ'' යනුවෙන් ව්‍යවහාර විය. නෙල්ලිගොඩ ජනාවාස වීමට ප්‍රථම රහතන් වහන්සේලා වැඩසිටි බවට සාක්ෂි වේ. නෙල්ලිගොඩ ග්‍රාමය පූර්වාරාම විහාරස්ථානය කේන්ද්‍රකොට ගනිමින් ද පතිරාජගම බෝ සෙවන විහාරය කේන්ද්‍ර කර ගනිමින් ද වාලුකා නදී හෙවත් මාදූ ගඟ පෙනෙන මානයේ පිහිටා ඇත.

මෙම ග්‍රාමයේ පිහිටි කතරගම කෝවිල හාස්කම්වලින් පිරි පුදසුනක් වශයෙන් ප්‍රචලිතය. දෙවියන් සඳහා වාර්ෂිකව පවත්වන උත්සවය මොවුන්ගේ එකමුතු කම ද විදහා පායි.

**<u>87 පරගහතොට</u>**

**වසමේ පිහිටීම**

| | |
|---|---|
| උතුර | - 87 ඒ වතුගෙදර දකුණ ග්‍රාම නිලධාරී වසම |
| නැගෙනහිර | - 87 සී වතුගෙදර ග්‍රාම නිලධාරි වසම හා අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කෙරම්ණිය ග්‍රාම නිලධාරි වසම |
| දකුණ | - 87 ඊ වඩුමුල්ල ග්‍රාම නිලධාරී වසම |
| බස්නාහිර | - 87 බී ආඳාදොළ ග්‍රාම නිලධාරී වසම |

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

පරගහතොට ප්‍රදේශය ගොඩපර ගස් හා නාන පොකුණු කිහිපයක් පැවති ප්‍රදේශයකි. ඒ නිසා මුල් කාලයේ දී මෙම ප්‍රදේශය ''පරගස්තොට'' යනුවෙන් හඳුන්වා ඇති අතර පසු කාලයේදී ''පරගහතොට'' යනුවෙන් ප්‍රචලිත වී ඇත.

අනාදිමත් කාලයක් තිස්සේ ඉපැරණි කලා ක්ෂේත්‍රයන්ට සම්බන්ධ වූවන් මුල් බැස ගත් පරම්පරාවල සාමාජිකයන් මෙන් ම කීර්තිමත් කලාකරුවන්ගෙන් ද මෙම වසම සමන්විත වේ. විහාර චිත්‍ර කර්මාන්තයේ ප්‍රවීණයන් වූ එල්.පී.ඒඩින්, වෛද්‍ය පී.හෙන්රි, ශිල්පී චාර්ලිස් මාස්ටර්, සුසිල් ප්‍රේමරත්න සේ ම රූකඩ කලාවේ දැවැන්තයා වූ පොඩිසිරිනා ගුරුන්නාන්සේගේ කනිටු පුත් පී.ජේම්ස් ඇතුළු පරපුර ද මෙම වසමේ පදිංචිකරුවන් වෙති.

සංගීතඥයන්, චිත්‍ර ශිල්පීන්, කැටයම්කරුවන්, රූකඩ හා වෙස් මුහුණු ශිල්පීන්, යකැදුරන්, වඩුවන් හා පෙදරේරුවන්, තුන්පත් රටා නිර්මාණකරුවන් සේ ම කුලීකරුවන් හා වෙනත් විවිධ වෘත්තීන්හී නිරතවන්නන්ගෙන් මෙම වසම සමන්විත වේ. ක්‍රමයෙන් පාරම්පරික වෘත්තීන්හී නිරතවන්නන් අඩු වෙමින් පවතින අතර යථෝක්ත පාරම්පරික කර්මාන්ත අභාවයට යමින් පවතින බවක් දක්නට ලැබේ.

**87 ඒ දකුණු වතුගෙදර**

**වසමේ පිහිටීම**

උතුර - 87 එච් පැටිවත්ත ග්‍රාම නිලධාරි වසම
නැගෙනහිර - 87 සී වතුගෙදර ග්‍රාම නිලධාරි වසම
දකුණ - 87 පරගහතොට ග්‍රාම නිලධාරි වසම
බටහිර - 87 බී ආදාදොළ ග්‍රාම නිලධාරි වසම

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

වතුගෙදර ග්‍රාමය පරිපාලන පහසුව සඳහා වතුගෙදර හා වතුගෙදර දකුණ ලෙස කොටස් දෙකකට වෙන් කර ඇත. ලෝහ කර්මාන්තය හෙවත් කම්මල් කර්මාන්තයේ යෙදී සිටි පිරිසක් ජීවත් වූ හෙයින් "වාත්තුගෙදර" නමින් ආරම්භයේදී නම් පට බැඳුණත් පසුකාලයක "වතුගෙදර" නමින් ව්‍යවහාර වූ බව පිළිගනී. මෑතකාලීනව ද මෙය පාරම්පරික රන් කර්මාන්තකරුවන්, පැස්සුම්කරුවන් හා කම්මල්කරුවන් වෙසෙන අර්ධ නාගරික ප්‍රදේශයකි.

**87 බී ආදාදොළ**

**වසමේ පිහිටීම**

උතුර - 90ඒ මහකරාව ග්‍රාම නිලධාරි වසම
නැගෙනහිර - 87එච් පැටිවත්ත ග්‍රාම නිලධාරි වසම
දකුණ - 87ඊ වඩුමුල්ල ග්‍රාම නිලධාරි වසම
බටහිර - 87එෆ් කුරුඳුවත්ත ග්‍රාම නිලධාරි වසම

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

මෙම ගමේ දොළක් තිබූ බවත් එම දොළ ආසන්නයේ රන් කඩුක්කන් දැමූ ආදෙකුගේ රුවක් සහිත නිධන් ගලක් පිහිටා තිබී ඇති හෙයින් "ආදාදොළ" යනුවෙන් හඳුන්වා ඇති බවත් කියවේ. එසේ වුවද තවත් මතයක දැක්වෙන්නේ මෙම ප්‍රදේශයේ වූ දොළක රන් පැහැයෙන් යුතු කඩුක්කන් දැමූ ආදෙක් ජීවත් ව සිටි බැවින් "ආදාදොළ" යනුවෙන් ප්‍රචලිත වූ බවයි. එම දොළ සිඳී යන විට මෙම ආදා මතුවන බවත් ආදා අල්ලන්නට ගිය කිහිප දෙනෙකුට ම විවිධ අනතුරුවලට මුහුණ පැමට සිදු ව ඇති බවත් කියවේ.

**87 සී වතුගෙදර**

**වසමේ පිහිටීම**

උතුර - 87 ඒ දකුණු වතුගෙදර ග්‍රාම නිලධාරී වසම
නැගෙනහිර - කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
දකුණ - අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
බටහිර - 87 ඩී සීනිගොඩ ග්‍රාම නිලධාරී වසම

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

වඩුකර්මාන්තයේ දක්ෂ ශිල්පියෙකු මෙම ගමේ පදිංචිව සිට ඇති අතර ගමේ සෑම කෙනෙක් ම තම නිවසට අවශ්‍ය පුටු, බංකු තැනීම ආදී සෑම දෙයකදී ම පිහිට පතා ඇත්තේ මෙම නිවසිනි. මුල් කාලයේදී මෙම නිවස හඳුන්වා ඇත්තේ "වඩු ගෙදර" යනුවෙන් බවත් කල් යාමේදී මෙම ප්‍රදේශය "වතුගෙදර" නමින් ව්‍යවහාර වූ බවත් සඳහන් වේ. තව ද මෙම ප්‍රදේශයේ තුඩුවක ආකාරය සකස් වූ භූමි ප්‍රදේශයක් තිබී ඇති අතර මේ හේතුව නිසා එම ප්‍රදේශය "තුඩුවේගොඩ" යනුවෙන් හඳුන්වා ඇත. ලෝහ

කර්මාන්තය හෙවත් කම්මල් කර්මාන්තයේ යෙදී සිටි පිරිසක් ජීවත් වූ හෙයින් ''වාත්තුගෙදර'' නමින් ආරම්භයේදී නම් පට බැඳුණත් පසුකාලයක ''වතුගෙදර'' නමින් ව්‍යවහාර වූ බව තවත් මතයකි.

## 87 ඩී සීනිගොඩ

**වසමේ පිහිටීම**

උතුර - 21 බී හීනටිය දකුණ ග්‍රාම නිලධාරි වසම
දකුණ - ඇල්පිටිය අම්බලන්ගොඩ ප්‍රධාන මාර්ගය
නැගෙනහිර - දීනවල ඇළ
බටහිර - 87 එච් පැටිවත්ත ග්‍රාම නිලධාරී වසම

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

මිට වසර ගණනාවකට පෙර වතුගෙදර ප්‍රදේශයේ බ්‍රිතාන්‍ය ජාතිකයන්ගේ පාලනය යටතේ උක් වගාව සහිත ඉඩමක් තිබී ඇති නිසා ප්‍රදේශවාසීන් කර්මාන්තයක් ලෙස සීනි කර්මාන්තයේ යෙදී ඇත. එනිසා ම උක් වගාව සහිත මෙම ඉඩම් ප්‍රදේශය ''සීනිගොඩ'' යනුවෙන් හඳුන්වා ඇති බව ප්‍රදේශවාසී පැරැන්නෝ කියා සිටිති. පසුව ශ්‍රී ලංකා රජය විසින් එක් පුද්ගලයෙකුට අක්කර 2 බැගින් බෙදා දී ඇත.පසුව ජනපද ඉඩම් ස්වර්ණ භූමි ඔප්පු ක්‍රමය යටතේ ඉඩම් ලබාදී ඇත.

## 87 ඊ වඩුමුල්ල

**වසමේ පිහිටීම**

උතුර - 87 පරගහතොට ග්‍රාම නිලධාරි වසම
නැගෙනහිර - 87 ජී විහාරගොඩ ග්‍රාම නිලධාරි වසම
දකුණ - 88 සී බෝගහවත්ත ග්‍රාම නිලධාරි වසම
බටහිර - 87 එෆ් කුරුඳුවත්ත ග්‍රාම නිලධාරි වසම හා මාදු ගඟ

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

87 ඊ වඩුමුල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයට වඩුමුල්ල, තොටවත්ත, පරගහතොට කොටසක් යනුවෙන් ගම් තුනක් අයත් වේ. වඩු කර්මාන්තයේ යෙදී සිටි බොහෝ දක්ෂ කාර්මිකයන් සිටීම නිසා ''වඩුමුල්ල'' යන නමින් හඳුන්වා ඇත. 1950 වර්ෂයේදී පමණ මෙම ග්‍රාමය තිබී ඇත්තේ නිවාස 32ක් පමණි. වටිනා දැව සහිත කැලෑවක් මෙම ග්‍රාමයේ තිබූ බවට තොරතුරු ඇත. එමෙන්ම විශාල තේක්ක වගාවක් ද තිබූ බවට සාධක පවතී. මේ වනවිට පවතින නිවාස යෝජනා ක්‍රම භූමිය එදා පොල් වගාවක් පැවති භූමියකි. එමෙන්ම මෙම භූමියේ හුණු කොටු දෙකක් තිබී ඇති අතර එම නිසා ''හුණුකොටුව වරන'' නමින් හඳුන්වා ඇත. 1956 වර්ෂයේදී වතුගෙදර ගම් සභාවේ සභාපතිතුමා වූ ඇල්.සී.ද සිල්වා මහතා මෙම ඉඩම් රජයට පවරා ගෙන ඇත. වඩුමුල්ල ග්‍රාමයේ වතුර බසින ඇළ මාර්ගය ''පරගස්තොට ඇළ'' නමින් හඳුන්වා ඇත. මෙම ඇළ දෙපස වතුර කණ්ඩි සාදා ගත් රෙදි අපුල්ලන පිරිස තම ජීවිකාව සරි කරගෙන ඇත. පරගස් විශාල වශයෙන් ඇති නිසා රෙදි අපුල්ලන අයගේ රෙදි සෝදන තොට නිසාත් ''පරගස්තොට'' නම් වේ. පරගස්තොට ඇලේ වතුර සුදුවැලිපතෙන් මාදු ගඟට ගලා යයි. ඔරු නවත්වන තොට බැවින් ''තොටවත්ත'' නම් වේ. 1984 වර්ෂයට පෙර මෙම ග්‍රාම නිලධාරී කොට්ඨාසය

පරගහතොට ග්‍රාම නිලධාරී කොට්ඨාසයට අයත් ව ඇත. ජනතා ව්‍යාප්තිය හා වැඩි පහසුකම් සැලසීම සඳහා වර්ෂ 1984 ග්‍රාම නිලධාරී වසම් ප්‍රතිශෝධනය යටතේ පරගහතොට කොට්ඨාසය නැවත කොට්ඨාස 8කට බෙදන ලදි. මේ අනුව 87 ඊ වඩුමුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසය වර්ෂ 1984 සිට ප්‍රතිශ්ඨාපනය වී ඇත.

## 87 එෆ් කුරුඳුවත්ත

**වසමේ පිහිටීම**

උතුර - 87 බී ආඳාදොළ ග්‍රා.නි.වසම කොටසක්
නැගෙනහිර - 87 බී ආඳාදොළ ග්‍රා.නි.වසම කොටසක්
දකුණ - 87 ඊ වඩුමුල්ල ග්‍රා.නි.වසම
බටහිර - මාදු ගඟ

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

කුරුඳුවත්ත ප්‍රදේශය අක්කර 36කින් යුතු කොටසකි. මෙය මුල් කාලයේ දී වෙන්දේසි කරන ලද ඉඩමකි. මෙම ප්‍රදේශය වෙන්දේසියේදී ලබා ගැනීම සඳහා මුස්ලිම් ජාතිකයින් පිරිසක් පැමිණ ඇත. එම ප්‍රදේශයේ ජීවත්වූ සිංහල මිනිසුන් වෙන්දේසි වේලාව පහුවෙනතුරු ඔවුන් වෙන ස්ථානයකට කැඳවා ආහාරපාන දී සංග්‍රහ කර ඇත. ඒ නිසා ඔවුන් හට එය මිලදී ගැනීමට නොහැකි වී ඇති අතර පසුව එය සිංහලයින් විසින් මිලදී ගෙන අක්කර තිස් හයක් පමණ විශාලවූ කැලෑවක් ව තිබූ එම ඉඩමේ කැලෑව එළි පෙහෙළි කොට කුරුඳු වගා කොට ඇත. පසුකාලයේදී ගම්වාසීන් විසින් මෙම එම ඉඩම "කුරුඳුවත්ත" යනුවෙන් හඳුන්වා ඇත.

## 87 ජී විහාරගොඩ

**වසමේ පිහිටීම**

උතුර - 87 පරගහතොට ග්‍රාම නිලධාරි වසම
නැගෙනහිර - අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කෙරම්ණිය ග්‍රා.නි වසම
දකුණ - අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කළුවඩුමුල්ල ග්‍රා.නි. වසම
බටහිර - 87 ඊ වඩුමුල්ල ග්‍රාම නිලධාරි වසම

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

අතීතයේ මෙම ප්‍රදේශයේ කන්දක පතිරාජ ඇමති ජීවත් සිට ඇති අතර ඔහු විසින් සාදන ලද විහාරයක් ද එහි තිබී ඇත. එම විහාරයේ කොටසක් මෑතක් වන තුරු ම ආරක්ෂාවී පැවති අතර එලෙස ඉතිරිවී තිබූ විහාර කොටස හේතුවෙන් එම ප්‍රදේශය "විහාර ගොඩැල්ල" නමින් හඳුන්වා ඇත. පසුව එය "විහාරගොඩ" ලෙසින් ව්‍යවහාරයට එක් වී ඇත. එසේ ම රූකඩ හා වෙස් මුහුණු කර්මාන්තය සඳහා මෙම වසම ප්‍රධානත්වයක් ගන්නා අතර අදටත් එම කර්මාන්ත පවතී. මෙම වසමේ සිටින කලාකරුවන් විවිධ සංස්කෘතික තරඟ සඳහා අදටත් සහභාගී වේ.

## 87 එච් පැටිවත්ත

**වසමේ පිහිටීම**

උතුර - 21 සී හීනටිය දකුණ ග්‍රාම නිලධාරි වසම
නැගෙනහිර - හීනටිය බළපිටිය ප්‍රධාන මාර්ගය
දකුණ - 87 සී වතුගෙදර ග්‍රාම නිලධාරි වසම

බටහිර - 87 බී ආඳාදොළ ග්‍රාම නිලධාරි වසම

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

87 එච් පැටිවත්ත වසම රජයේ නිවාස යෝජනා ක්‍රමයක් හා පෞද්ගලික ඉඩම් හා නිවාසවලින් සමන්විත වේ. මුලින් 87 පරගහතොට නමින් හඳුන්වනු ලැබූ මෙම වසම අනුවසම්වලට බෙදන ලදි. 87 එච් පැටිවත්ත එලෙස අනුකොටසක් බවට පත් වූ බල ප්‍රදේශයකි.

**<u>88 රන්දොඹේ දකුණ</u>**

**වසමේ පිහිටීම**

උතුර - 88 බී රන්දොඹේ උතුර ග්‍රාම නිලධාරි වසම
නැගෙනහිර - කුඩ කලපු ගඟ
දකුණ - අම්බලන්ගොඩ නගර සභා සීමාව
බටහිර - ඉන්දියන් සාගරය

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

දේව පතිරාජ ඇමතිතුමා දොඹ කැලයක් විනාශ කර ප්‍රතිකාර සහිත ආරාමයකින් යුතු අංගසම්පූර්ණ ගම්මානයක් කරවා සංවර්ධනය කර ඇත. අධික සන්තෝෂයට පත් ගම්වැසියෝ රනින් දොඹ මාලයක් කරවා ඇමතිතුමාට පැළඳවීමේ උපහාර මහෝත්සවයක් පවත්වා ඇත. මෙම ඓතිහාසික සිද්ධිය පසුබිම් කරගෙන ‘‘අරන්දොඹ’’ යන නාමය පට බැඳී පසුව ‘‘රන්දොඹේ’’ යනුවෙන් ව්‍යවහාර වූ බව ඉතිහාසයේ සඳහන් වේ.

තවත් මතයක් වන්නේ බොහෝ කාලයකට පෙර මෙම ග්‍රාමයේ දොඹ අරණක් තිබී ඇති අතර එම දොඹ අරණේ දොඹ ගෙඩි ඉදී වැටීමේදී රන් පැහැයක් ගැනීම නිසා "රන් දොඹ" ලෙසත් ඉන්පසු රන්දොඹේ යනුවෙන් නම හැඳුනු බවත් ය. මෙම ගම ඓතිහාසික වශයෙන් වැදගත් වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරන ලද ආචාර්ය කෙල්වින් ආර් ද සිල්වා මහතා සහ මින්නේරිය දෙවියා වශයෙන් විරුදාවලිය ලත් සී.පී. සිල්වා මැතිතුමාත් ජන්මය ලබා ඇත්තේ මේ ගමේදී වීම ය. II වන පණ්ඩිත පරාක්‍රමබාහු රජ සමයේ දඹදෙණි රාජධානි යුගයේ දේව පතිරාජ අමාත්‍යවරයා විසින් සාධන ලද ඓතිහාසික විහාරස්ථානයත් වන සංඝරාජ විහාරස්ථානය ද මෙම වසම තුළ පිහිටා ඇත. වර්තමානයේ සංඝරාජ විහාරය නම් වූ මෙම විහාරය අතීතයේ සමුද්‍රාරාමය ලෙස හඳුන්වා ඇත.

**<u>88 ඒ කන්දෙගොඩ</u>**

**වසමේ පිහිටීම**

උතුර - 87 ඊ විහාරගොඩ ග්‍රාම නිලධාරි වසම
නැගෙනහිර - අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කළුවඩුමුල්ල ග්‍රා.නි. වසම
දකුණ - අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
බටහිර - 88 සී බෝගහවත්ත ග්‍රාම නිලධාරි වසම

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

රන්දොඹේ දකුණු කොටසට ඒකාබද්ධව පැවති කන්දෙගොඩ ග්‍රාමයට මෙම නම ලැබී ඇත්තේ කන්දෙගොඩ විද්‍යාලය ස්ථාපිත කිරීමත් සමඟය. නිදහස් අධ්‍යාපනයේ පියා වූ ආචාර්ය සී.ඩබ්.ඩබ්.කන්නන්ගර මහතා ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපන ක්‍රමය ආරම්භ කොට අධ්‍යාපනයේ නවෝදයක් ඇති කරන විට එතුමා ජන්මය ලැබූ රන්දොඹේ ගම්මානයේ ද යම් පිබිදීමක් ඇති වන්නට

විය. ඒ මහතාගේ අධ්‍යාපන නවෝදයට අත්වැලක් වශයෙන් පාසලක් ආරම්භ කිරීමට දානපති රුවන්පුර සිමාරිස් ද සිල්වා මුදලාලි මහතාට අවශ්‍ය වී ඇත. ඒ වනවිටත් රන්දොඹේ කනිෂ්ඨ විද්‍යාලය නමින් විදුහලක් ගාලු පාර ආසන්නයේ පවත්වාගෙන යමින් තිබුණි. නව පාසලක් ආරම්භ කරන විට රන්දොඹේ ගමට පාසල් දෙකක් නම් කිරීමට නොහැකි තත්ත්වයක් උදා විණි. ඊට පිළියමක් ලෙස වඩාත් උස් නොවූ කඳු ප්‍රදේශයක් වන හෙයින් "කන්දෙගොඩ කනිෂ්ඨ විද්‍යාලය" යන නමින් නව පාසලට නම් තබන ලදි. ඒ හේතුවෙන් එම පාසල පිහිටි ප්‍රදේශය කන්දෙගොඩ නමින් ප්‍රචලිත විය. සාම්ප්‍රදායික වෙස් මුහුණු, කැටයම් කලාවේ නියුතු පවුල් රැසක් ද පාරම්පරිකව මෙහි ජීවත් වේ.

## 88 බී රන්දොඹේ උතුර

**වසමේ පිහිටීම**

උතුර - අම්බා හෝටලය (පොදු සුසාන භූමිය)
නැගෙනහිර - මාදූ ගඟ
දකුණ - විජය මාවත
බටහිර - ඉන්දියන් සාගරය

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

රන්දොඹේ ග්‍රාමය උතුර සහ දකුණ වශයෙන් ග්‍රාම නිලධාරී වසම් දෙකකට වෙන් කර ඇත. 88 බී රන්දොඹේ උතුර ග්‍රාම නිලධාරී වසමේ ඇත්නාවල විහාරය හෙවත් සුචිත්‍රාරාම විහාරස්ථානය වටා ද ජනප්‍රවාදයන් ඇත. පෙර රජුන් කල මෙම විහාරස්ථානයේ ළිඳක් පැවති අතර ඇතුන් නාවා ඇත්තේ එම ළිඳෙනි. එම නිසා ඇතුන් නැවූ ළිඳ හෝ ස්ථානය යන අර්ථයෙන් ඇත්නාවල විහාරස්ථානය යනුවෙන් ප්‍රසිද්ධියට පත් ව ඇත. වර්තමානයේදී එම ළිඳ දකින්නට නැති වුව ද මෙම විහාරස්ථානය ඇත්නාවල විහාරස්ථානය යනුවෙන් හඳුන්වනු ලැබේ.

තවද 88 බී රන්දොඹේ උතුර ග්‍රාම නිලධාරී වසමේ මහා ප්‍රඥාවන්තයින්ගේ උපත සනිටුහන් කර ඇත. ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා නම් සුප්‍රකට නඩුකාරතුමා මෙම ග්‍රාමයෙහි උපත ලබා ඇත. එමෙන්ම සී.පී.ද සිල්වා මහතා ද මෙම ග්‍රාමයේ උපත ලබා ඇති බවට තොරතුරු දැනගන්නට ලැබී ඇත.

## 88 සී බෝගහවත්ත

**වසමේ පිහිටීම**

උතුර - වඩුමුල්ල ග්‍රාම නිලධාරි වසම
නැගෙනහිර - දුම්රිය මාර්ගය හා කන්දෙගොඩ ග්‍රාම නිලධාරි වසම
දකුණ - පටබැදිමුල්ල ග්‍රාම නිලධාරි වසම
බටහිර - හෙප්පුමුල්ල ග්‍රාම නිලධාරි වසම හා රන්දොඹේ දකුණ ග්‍රාම නිලධාරි වසම
අම්බලන්ගොඩ - ඇල්පිටිය මාර්ගයේ මාර්ගය දෙපස වසම පිහිටා ඇත.

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

බෝගහවත්ත යන නම එම ගමට ලැබී ඇත්තේ ගමේ පිහිටා තිබූ ඇසතු බෝ ගසක් නිසා බව කියවේ. මෙම බෝ ගසට ප්‍රදේශවාසීන් පුද පූජා පවත්වා ඇත. ප්‍රදේශවාසීන්ට කිසියම් රෝගාබාධයක් හෝ පවුලේ අයට කිසියම් කරදරයක් වූ විට විශාල වශයෙන් මෙම බෝ ගසට පූජා පැවැත්වීම සිදු කරනු ලබයි.

## 89 බළපිටිය

**වසමේ පිහිටීම**

| | |
|---|---|
| උතුර | - 20 බී බ්‍රාහ්මණවත්ත දකුණ ග්‍රාම නිලධාරී වසම |
| නැගෙනහිර | - මාදූ ගඟ හා 21 ඊ ඇළතොට ග්‍රාම නිලධාරි වසම |
| දකුණ | - 89 බී බේරතුඩුව ග්‍රාම නිලධාරි වසම |
| බටහිර | - ඉන්දියන් සාගරය |

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

දේවපතිරාජ නම් ඇමතියාගේ බට පිරිස් රඳවා සිටි ස්ථානය අතීතයේදී බටපිටිය ලෙස හඳුන්වන ලදී. කාලයක් සමග එම බටපිටිය ලෙස හැඳින්වූ ප්‍රදේශය ජන වහරයත් සමග බළපිටිය නම් විය.

මහනුවර රාජධානී සමයට අයත් යැයි සැලකෙන බළපිටිය සුභද්‍රාරාම විහාරස්ථානය ද පිහිටා ඇත්තේ 89 බළපිටිය වසම තුලයි. එම විහාරස්ථානයේ මහනුවර සම්ප්‍රදායට අයත් සිතුවම් ද දක්නට ඇත.

ඉංග්‍රීසි සමයේ මිෂනාරි ව්‍යාපාරයට එරෙහිව නැගී සිටිමින් මිෂණාරීන් සමග මුහුනට මුහුන ලා පංචමහාවාදයන් පැවැත් වූ අභීත බලපිටි පුත්‍ර මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ගේ ජාතක භූමිය වන්නේ ද 89 බළපිටිය වසම තුල පිහිටා ඇති මිගෙට්ටුවත්තයි. මිගාර නමැති මොහොට්ටාල කෙනෙකු පදිංචිව සිටි බැවින් එලෙස හඳුන්වන බව කියයි. මොහොට්ටිවත්ත නමින් ද ගමක් වේ. එනමින් හඳුන්වන්නේ එම ගෙමෙහි "මොහොට්ටාල" කෙනෙකු පදිංචිව සිටි බැවිනි. මුල් කාලයේදි මොහොට්ටාලවත්ත වී ඇති බවත් පසුව "මොහොට්ටිවත්ත" වී ඇති බවත් කියැවේ. කෙසේ නමුත් මෙහි පදිංචි වී සිටි මොහොට්ටාලවරුන් හේතුවෙන් මෙම ගම් සැදුණු බව පිළිගත හැක.

බළපිටිය සංවර්ධනයට උරදුන් රොබට් ද සොයිසා මහතාගේ ජන්මභූමිය වන්නේ ද 89 බළපිටියයි. එතුමා ජීවත් වූ ගරුමුණි වලව්ව ද පිහිටා ඇත්තේ 89 බළපිටිය වසම තුලයි. එම වලව්වට අයත් විශාල භූමි ප්‍රමාණයක් දැයේ දූ දරුවන් වෙනුවෙන් පාසලක් නිර්මාණය කිරීමට ලබා දීම මෙතුමන් බළපිටියට කළ සේවයෙන් එකකි. අද එම පාසල සිද්ධාර්ථ මහා විද්‍යාලය නම් වේ.

## 89 ඒ වලගෙදර

**වසමේ පිහිටීම**

| | |
|---|---|
| උතුර | - 89 බී බේරතුඩුව ග්‍රාම නිලධාරී වසම |
| නැගෙනහිර | - මාදූ ගඟ |
| දකුණ | - 88 රන්දොඹේ උතුර ග්‍රාම නිලධාරි වසම |
| බටහිර | - ඉන්දියන් සාගරය |

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

විශාල වනාන්තරයක් මෙම ප්‍රදේශයේ තිබී ඇති අතර එම වනය කොටක තැනු කුඩා නිවසක එක්තරා පවුලක් පදිංචිව සිට ඇත. එම නිවස වලගෙදර යනුවෙන් බොහෝ දෙනා හඳුන්වා ඇති අතර එ නිසා ම මෙම ප්‍රදේශය ද "වලගෙදර" යනුවෙන් ප්‍රචලිත වී ඇති බව සඳහන් වේ.

## 89 බී බේරතුඩුව

**වසමේ පිහිටීම**

උතුර - 89 ඒ වලගෙදර ග්‍රාම නිලධාරී වසම
දකුණ - 89 බළපිටිය ග්‍රාම නිලධාරී වසම
නැගෙනහිර - ඉන්දියන් සාගරය
බටහිර - 87 බී ආඳාදොල ග්‍රාම නිලධාරී වසම

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

බේරතුඩුව ප්‍රදේශයේ දේවපතිරාජ අමාත්‍යවරයා විසින් වෙහෙරක් ඉදි කර ඇත. එමෙන්ම ඊට ආසන්නයේ ම විහාරස්ථානයක් ද ඉදි කර ඇති බවත්, එම විහාරයට වෙහෙරේ කොත් කැරැල්ල පෙනුණු බැවින් මෙම වෙහෙර ඉදි කර තිබූ ප්‍රදේශය ''වෙහෙර තුඩුව'' යනුවෙන් හඳුන්වා ඇත. පසුකාලයේදී මෙය ''බේරතුඩුව'' ලෙස හඳුන්වා ඇති බවත් කියවේ. එමෙන් ම තුඩුවක් ලෙස මෙම ප්‍රදේශය වෙන් ව තිබූ බවත් එනිසා මෙම ප්‍රදේශය ''බේරතුඩුව'' ලෙස හඳුන්වා ඇති බවත් තවත් මතයකි.

## 90 වඳදූව

**වසමේ පිහිටීම**

උතුර - බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
දකුණ - අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
නැගෙනහිර - කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
බටහිර - ඉන්දියන් සාගරය

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

වඳ බවින් යුත් ප්‍රාදේශීය රජ කෙනෙකු මෙම ප්‍රදේශය පාලනය කර ඇත. එනිසා මෙම ප්‍රදේශය ''වඳදූව'' ලෙස හඳුන්වා ඇතැයි කියවේ. වඳදූව යැයි කියන විට බොහෝ දෙනෙකු කියා සිටින්නේ මෙය දූපතක් ව පැවති බවයි. එහෙත් මෙම ගම්මානය මාදු ගඟට මායිම් වන්නේ තුන් පැත්තකින් පමණක් වන හෙයින් දූපතක් ලෙස ගණන් නොගැනේ.

## 90 ඒ මහකරාව

**වසමේ පිහිටීම**

උතුර - 90 වඳදූව ග්‍රාම නිලධාරි වසම
දකුණ - 89 බී බේරතුඩුව ග්‍රාම නිලධාරි වසම හා 87 බී ආඳාදොළ ග්‍රාම නිලධාරි වසම
නැගෙනහිර - 21 සී හීනටිය දකුණ ග්‍රාම නිලධාරි වසම
බටහිර - 21 ඊ ඇලතොට ග්‍රාම නිලධාරි වසම

**වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම**

මහකරාව ග්‍රාමය පිළිබඳව ඓතිහාසික තොරතුරු වලට අනුව එහිදී ඉදිකළ දේවාලවලින් ප්‍රත්‍යක්ෂ වන්නේ දඹදෙණිය යුගයේ මෙකී ප්‍රදේශ ජනාවාස වී ඇති බවයි.

වඳදූව ගමට දකුණින් විශාල කැරන් (පලා වර්ගයක්) යායක් තිබී ඇත. ඒ නිසාවෙන් එම ප්‍රදේශය මහා කැරැව ලෙස හඳුන්වා ඇති බවත් පසු කාලයක එය ''මහකරාව'' ලෙස හඳුන්වා ඇති බවත් කියවේ. තවත් මතයක දැක්වෙන්නේ මෙම ප්‍රදේශය විශාල කැලෑ ප්‍රදේශයක් බවත් ඒ හේතුවෙන් මෙම ගම මුල්

කාලයේදී "මහකැලැව" ලෙස හඳුන්වා ඇති බවත් පසුව "මහකරාව" ලෙස හඳුන්වා ඇති බවත් ය. අතීතයේ පහත් යැයි සම්මත කුලවලින් පැවිදි වූ අයට උපසම්පදාව ලබා නොදීම නිසා බුරුමයේ අමරපුරයට ගොස් උපසම්පදාව ලබා පැමිණ පහත් කුලවලින් පැවිදි වන අයට උපසම්පදාව ලබා දීමට කටයුතු කළ, අමරපුර නිකායේ ආදි කර්තෘ ශ්‍රී ඤාණවිමල තිස්ස නාහිමිපාණන් ජන්ම ලාභය ලබා ඇත්තේ ද මෙම ගමේ ය.